පත්‍රිකා මාලාව
අංක 1

# මිල ස්ථායිතාවය



මිල ස්ථායිතාවය පවත්වාගැනීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණු දෙකින් එකකි. මිල ස්ථායිතාවය යනු කුමක් ද? එය මණිනු ලබන්නේ කෙසේද? එය වැදගත් වන්නේ මන්ද? යනාදිය සහ මිල ස්ථායිතාවය කෙරේ බලපාන්නා වූ කරුණ මෙම පත්‍රිකාව මගින් පැහැදිලි කෙරේ. එසේම, උද්ධමනය පාලනය කිරීම සඳහා යොදගැනෙන විවිධ ක්‍රියාමාර්ග සහ මිල ස්ථායිතාවය ලගා කරගැනීම හා පවත්වා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්තිය භාවිතා කරනු ලබන්නේ කෙසේ ද? යන්න පිළිබඳ කරුණු ද මෙ මගින් විස්තර කෙරේ. මෙම පත්‍රිකාවේ අරමුණ වන්නේ, මිල ස්ථායිතාවය ලගා කර ගැනීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය හා අවබෝධය වර්ධනය කිරීමයි.

ශ්‍රී ලංකා මහ බැංකුව

ඔක්තෝබර් 2005

## මිල ස්ථායිතාවය යනු කුමක් ද ?

මිල ස්ථායිතාවය යනු පාරිභෝගික භාණ්ඩවල සාමාන්‍ය මිල මට්ටම නොවෙනස්ව පැවතීම හෝ එය වෙනස්වන්නේ නම්, එසේ වන්නේ ආර්ථිකයක කුටුම්භ හා ව්‍යාපාරික ආයතනවල ආර්ථික තීරණ ගැනීම කෙරේ සැලකිය යුතු බලපෑමක් ඇති නොවන ආකාරයේ අඩු වේගයකින්ය යන තත්ත්වයන් විස්තර කිරීම සඳහා භාවිතාවන ආර්ථිකවිද්‍යාත්මක වචනයකි. පරිභෝජනය, ආයෝජනය, නිෂ්පාදනය හෝ වෙළෙඳාම යනාදී කටයුතුවල යෙදීමේ දී මිලදීගන්නන් හෝ අලෙවිකරුවන් වශයෙන්, අපි එදිනෙද විවිධාකාර වූ මිල ගණන්වලට මුහුණ දෙන්නෙමු. භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම හා සැපයුම අනුව මිල ගණන් වෙනස්වීම වෙළෙඳපළ ආර්ථිකයක සාමාන්‍ය සංසිද්ධියකි. මිල ගණන් වෙනස්වීම දෙදිශාවටම සිදුවන නිසාත්, එම වෙනස්වීම් විවිධ ප්‍රමාණයෙන් සිදුවීම නිසාත් එක් එක් මිල ගණන් තනි තනිව ගෙන විග්‍රහ කිරීමෙන්, සාමාන්‍ය මිල මට්ටමේ සිදුවන වෙනස්කම් හඳුනාගැනීම දුෂ්කර වේ. එමනිසා, ආර්ථික සංකල්පයක් වන සාමාන්‍ය මිල මට්ටම යන්න භාවිත වන්නේ එක් එක් මිල ගණන් වල වෙනස්වීමේ සමස්ථ බලපෑම හඳුනා ගැනීම සඳහාය. ඒ අනුව, මිල ස්ථායිතාවය යනු ආර්ථිකයේ සාමාන්‍ය මිල මට්ටමේ සාපේක්ෂ ස්ථායිතාවය වන අතර, එයින් එක් එක් මිල ගණන්වල ස්ථායිතාවය හෝ ස්ථාවර බව හෝ ගම්‍ය නොවේ. ඇමෙරිකානු ෆෙඩරල් බැංකු ක්‍රමයේ සභාපති වන ඇලන් ග්‍රීන්ස්පෑන් මෙය වඩාත් පැහැදිලිව මෙසේ පවසා ඇත. 'සියළුම ප්‍රායෝගික තත්ත්වයන් සඳහා, මිල ස්ථායිතාවය යනු ව්‍යාපාරික සහ කුටුම්භ වල තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති නොවන ආකාරයෙන්, සාමාන්‍ය මිල මට්ටමේ අපේක්ෂිත වෙනස්වීම් ඉතා සුළු වීමත්, එය ක්‍රමිකව සිදුවීමත්ය.[1]

## මිල ස්ථායිතාව මනිනු ලබන්නේ කෙසේද ?

අප වඩාත් සැලකිලිමත් වන්නේ මිල ගණන් වල සාමාන්‍ය ඉහළයෑම් (හෝ පහළ යාම්) පිළිබඳ මිස යම් විශේෂිත භාණ්ඩයක හෝ සේවාවක මිල ඉහළ යාම (හෝ පහළයාම) පිළිබඳව නොවන නිසා, සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්වීම් හඳුනාගත හැකි මිණුම් දණ්ඩක් සොයා ගැනීම අවශ්‍ය වේ. සාමාන්‍ය මිල මට්ටම මනිනු ලබන්නේ සංඛ්‍යානාත්මක උපකරණයක් වන මිල දර්ශකයක් මගිනි. මිල දර්ශකයක් යනු හුදෙක් තෝරාගත් භාණ්ඩ හා සේවා පැසක මිල ගණන්හි බරතබන ලද සාමාන්‍ය මිල වන අතර, එක් එක් අයිතමයේ බරිතය වන්නේ, භාණ්ඩ මල්ලේ වටිනාකමින් ඒ ඒ භාණ්ඩයේ පංගුවයි. නිෂ්පාදනයේ සිට අවසාන පරිභෝජනය දක්වා වූ විවිධ පියවරවලදී මිල ගණන්හි සිදුවන වෙනස්කම් වල සමස්ථ උපනතින් මනිනු ලබන මිල දර්ශක, පාරිභෝගික මිල දර්ශක, තොග මිල දර්ශක සහ නිෂ්පාදන මිල දර්ශක යනුවෙන් විවිධාකාරවේ. නමුත් සමාජයක බොහෝ පුද්ගලයින් පාරිභෝගිකයින් වශයෙන් මුහුණ දෙන මිල ගණන් වල වෙනස්වීම් නිරූපණය කරන නිසා, පාරිභෝගික මිල දර්ශක බහුලව භාවිතා කෙරෙන මිල දර්ශක වේ. එසේ වුවත්, අනාගත පාරිභෝගික මිල ගණන් වල හැසිරීම පෙන්වන දර්ශකයන් ලෙස තොග මිල දර්ශක හා නිෂ්පාදන මිල දර්ශක ගණනය කිරීම ද වැදගත් වේ.

පාරිභෝගික මිල දර්ශකයක් මගින් මනිනු ලබන්නේ නියෝජනාත්මක පාරිභෝගික භාණ්ඩ හා සේවා පැසක මිල ගණන් වල සාමාන්‍ය හැසිරීමයි. පාරිභෝගික වියදම් රටාව පිළිබඳ වූ සමීක්ෂණයක් පදනම් කරගෙන පැසෙහි අඩංගු විය යුතු භාණ්ඩ හා සේවා තෝරා ගන්නා අතර, මුලු වියදම් ප්‍රමාණය තුළ එක් එක් භාණ්ඩය දරණ පංගුව අනුව ඒවා එකිනෙකෙහි බර තැබීම සිදු කරනු ලැබේ. එනම් පාරිභෝගිකයන්ගේ මුලු වියදමින් විශාල කොටසකට හිමිකම් කියනු ලබන භාණ්ඩ හා සේවා සඳහා වැඩි බරක් තබනු ලැබේ. මිල ගණන් ස්ථාවරව තිබිය දී භාණ්ඩ පැසෙහි අඩංගු දෑවල වෙනස්කම් නිසා හෝ භාණ්ඩ පැස ස්ථාවරව තිබියදී ඒවායේ මිල ගණන් වෙනස්වීම නිසා හෝ එම දෙකෙහිම සිදුවන වෙනස්වීම් නිසා හෝ මුලු පරිභෝජන වියදම හෙවත් ජීවන වියදම කලින් කලට වෙනස් වේ. නමුත් පරිභෝජන රටාවට බලපාන්නා වූ සාධක සෙමින් වෙනස්වන නිසා, සාමාන්‍යයෙන් අවුරුදු 3 සිට 5 ක් දක්වා පමණ කාලයක් පුරා සමාජයක සාමාන්‍ය පාරිභෝජන පැස සමස්ථයක් ලෙස ස්ථාවරව පවතී යැයි උපකල්පනය කිරීම සාධාරණවේ. පාරිභෝගික මිල දර්ශකයට අයත් භාණ්ඩ හා සේවා පැස නොවෙනස්ව පවතී යැයි

1 1989 ඇමෙරිකානු කොංග්‍රස් සභාව ඉදිරියේ දී කරන ලද කථාවකි.

**සංඛ්‍යා සටහන 1 - පාරිභෝගික මිල දර්ශකය (පා.මි.ද.) - උදාහරණයක්**

| අයිතමය | ඒකකය | මසකට පරිභෝජනය කරනු ලබන ඒකක ප්‍රමාණය | ඒකකයක මිල | | | ඒ ඒ මිල ගණන් අනුව වියදම | | | මිල ගණන්වල වෙනස්වීම | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | පදනම් වසර රු. | පළමු වසර රු. | දෙවන වසර රු. | පදනම් වසර රු. | පළමු වසර රු. | දෙවන වසර රු. | පළමු වසර % | දෙවන වසර % |
| සහල් | කි.ග්‍රෑ. | 20 | 20.00 | 22.00 | 23.00 | 400.00 | 440.00 | 460.00 | 10.0 | 4.5 |
| පාන් | ග්‍රෑම් 450 | 10 | 8.00 | 9.00 | 10.00 | 80.00 | 90.00 | 100.00 | 12.5 | 11.1 |
| බෝංචි | කි.ග්‍රෑ. | 5 | 40.00 | 45.00 | 46.00 | 200.00 | 225.00 | 230.00 | 12.5 | 2.2 |
| පොල් | ගෙඩි | 12 | 10.00 | 7.00 | 11.00 | 120.00 | 84.0 | 132.00 | -30.0 | 57.1 |
| මාළු (බලයා) | කි.ග්‍රෑ. | 2 | 125.00 | 132.00 | 135.00 | 250.00 | 264.00 | 270.00 | 5.6 | 2.3 |
| සීනි | කි.ග්‍රෑ. | 3 | 30.00 | 28.00 | 31.00 | 90.00 | 84.00 | 93.00 | -6.7 | 10.7 |
| විදුලිය | වොට්ස් | 60 | 5.00 | 6.00 | 6.30 | 300.00 | 360.00 | 375.00 | 20.0 | 4.2 |
| බස් ගාස්තු | ගමන් වාර | 40 | 7.00 | 8.00 | 8.50 | 280.00 | 320.00 | 340.00 | 14.3 | 6.3 |
| මුළු එකතුව | - | - | - | - | - | 1720.00 | 1867.00 | 2000.00 | | |
| දර්ශකය | - | - | - | - | - | 100.00 | 108.60 | 116.30 | | |
| උද්ධමනය | | - | - | - | - | - | | | 8.6% | 7.1% |



Final Proof 2006. 06. 19

උපකල්පනය කළහොත්, එහි වෙනස්වීම් මගින් නිරූපනය වන්නේ හුදෙක් භාණ්ඩ පැසෙහි එක් එක් අයිතමයේ මිල ගණන්වල වෙනස්වීමේ ශුද්ධ ප්‍රතිඵලයයි.

1 වැනි වගුවේ දී ඇති උදහරණය අනුව පරිභෝජන භාණ්ඩ පැසෙහි වියදම මෙන්ම ගණනය කරන ලද පාරිභෝගික මිල දර්ශකය ද පළමු වසරේ සිට දෙවන වසර දක්වා කාලය තුළදී සියයට 8.6 කි න් වැඩි වී ඇති අතර, භාණ්ඩ පැස නොවෙනස්ව පවතින නිසා එයින් නිරූපනය වන්නේ කාල පරිච්ජේද දෙක අතර මිල ගණන්වල වෙනස්වීම පමණි. පාරිභෝගිකයෙකුට වඩාත් වැදගත් වන්නේ විවිධ මිල වෙනස්වීම් නිසා තම මුළු ජීවන වියදමට සිදුවන වෙනස්වීම් මිස, එක් එක් භාණ්ඩයේ මිල ගණන්වල  වෙනස්වීම් නොවන නිසා, අප අවධානය යොමු කරන්නේ සමස්ථ මිල දර්ශකයේ වෙනස්කම් පිළිබඳව මිස එක් එක් භාණ්ඩයේ මිල ගණන්වල වෙනස්වීම් පිළිබඳව නොවේ.

දැනට ලංකාවේ භාවිතා වන නිල මිල දර්ශකය වන්නේ කොළඹ පාරිභෝගික මිල දර්ශකයයි (කො.පා.මි.).  එය සාද ඇත්තේ 1952 දී කොළඹ නගර සභාව ඇතුළත ජීවත් වූ, තම මාසික ආදයම අනුව පෙළ ගැස්වූ විට පහළම මට්ටමේ ජීවත් වූ සියයට 40 ක කුටුම්භවල වියදම් රටාව මතයි. පාරිභෝගික පැසෙහි අඩංගු භාණ්ඩ හා සේවාවන් යල් පිනූ ඒවා වීම, ආදයම් කාණ්ඩ සීමිත ප්‍රමාණයක් පමණක් නියෝජනය වීම සහ ආවරණය වන්නා වූ භූගෝලීය ප්‍රදේශය සීමා වීම යනාදි කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පවතින දුර්වලකම් මග හැරවීමේ අරමුණින්, නිල මිල දර්ශකය ගණනය කරනු ලබන ජන ලේඛන  හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා පරිභෝගික මිල දර්ශකය (ශ්‍රී.ලං.පා.මි.ද.) නමින් නව දර්ශකයක් හඳුන්වා දී ඇත.

1995 සහ 1997 අතර වර්ෂ වලදී උතුරු සහ නැගෙනහිර පළාත් හැර මුලු රටේම මාසික ආදයම අනුව පෙළ ගැස් වූ විට පහළම සියයට 80 ට අයත් කුටුම්භවල වියදම් රටාව මත ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකය පදනම්ව ඇත[2]. කෙසේ වුවත්, එය තවම නිල මිල දර්ශකය වශයෙන් පිළිගෙන නැත. අනෙකුත් ඕනෑම සංවර්ධනය වෙමින් පවත්නා රටවල මෙන්, ශ්‍රී ලංකාවේද සාමාන්‍ය පාරිභෝගිකයෙකුගේ වියදම් රටාව පෙන්නුම් කරමින්, ආහාර පාන සඳහා වැඩි බරක් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ සහ ශ්‍රී ලංකා පාරිභෝගික මිල දර්ශකය තුළ ලබා දී තිබේ. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටම් වල හැසිරීම මැනීම සඳහා තවත් මිල දර්ශක දෙකක් ඇත. එනම් ප්‍රාථමික වෙළෙඳපොළේ මිල හැසිරීම් මැනීම සඳහා භාවිත කරන තොග වෙළෙඳ මිල දර්ශකය (තො.මි.ද.) සහ රටේ දළ ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමේදී ඇතුළත් කරන්නාවූ සියලුම භාණ්ඩ හා සේවා ආවරණය කරමින් සාමාන්‍ය මිල මට්ටම මනිනු ලබන වඩාත් පුළුල් මිනුමක් වූ දළ ජාතික නිෂ්පාදිත අවධමනකය (ද.ජා.නි.අ.) යන ඒවා යි.

## උද්ධමනය හෝ අවධමනය යනු කුමක් ද ?

උද්ධමනය යනු මිල ගණන්වල ඉහළ නැගීම බව බොහෝ පුද්ගලයින් දන්නා කරුණකි. නමුත්, වෙළෙඳපොළ ආර්ථිකයක මිල ගණන් නිරන්තරයෙන් ඉහළ පහළ යන නිසා උද්ධමනය යනු හුදෙක් එක් එක් භාණ්ඩයේ මිල ගණන්වල ඉහළ යාම නොවන බව වටහා ගැනීම වැදගත් වේ. උද්ධමනය යනු ආර්ථිකයක සියලුම අංශවල කාලයක් පුරා සිදුවන මිල ගණන් ඉහළ යාම පිළිබිඹු කරන සාමාන්‍ය සංසිද්ධියකි. එය සාමාන්‍ය මිල මට්ටමේ අඛණ්ඩ ඉහළ යාම දැක්වීම සඳහා භාවිතා කරනු ලබන ආර්ථික විද්‍යාත්මක වචනයකි. එසේම අවධමනය යනු සාමාන්‍ය මිල මට්ටමේ අඛණ්ඩ පහළ වැටීමයි. රටක සාමාන්‍ය මිල මට්ටම නිරූපනය කරනු ලබන ඕනෑම මිල දර්ශකයක් තුළින් උද්ධමනය/අවධමනය ඇස්තමේන්තු කළ හැකිය. උද්ධමනයේ පහළ වැටීමක් (සමහර අවස්ථාවලදී නිර්-උද්ධමනය නමින් හඳුන්වන), පාරිභෝගික මිල ගණන්වල සාමාන්‍ය පහළ වැටීමක් පෙන්නුම් නොකරන බව වටහා ගැනීම වැදගත් වේ. එයින් පෙන්නුම් කරන්නේ සාමාන්‍ය මිල මට්ටම ඉහළ යාමේ වේගය අඩුවීමකි. ඉහත සංඛ්‍යා සටහන 1 හි දී දැක්වෙන උදහරණය අනුව පළමු වසරේ සියයට 8.6 ක් වූ උද්ධමනය දෙවන වසරේදී සියයට 7.1 දක්වා පහත වැටුන ද , දෙවන වසරේදී ද සියලුම භාණ්ඩවල මිල ගණන් ඉහළ ගොස් ඇත. සාමාන්‍ය මිල මට්ටමේ පහත වැටීමක් දැක්වෙන්නේ අවධමනයකදී පමණි. ඒ අනුව, මිල ස්ථායිතාවය යනු ආයතන සහ කුටුම්භ වල ආර්ථික තීරණ ගැනීම කෙරෙහි බලපෑමක් ඇති කිරීමට තරම් බලවත් නොවූ අඩු මට්ටමක උද්ධමනයක් හෝ අවධමනයක් බව දැන් පැහැදිලිවේ.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව, කොළඹ නගර සභා ප්‍රදේශය තුළ ජීවත්වන, ආදයම අනුව පහළම  සියයට 40 කාණ්ඩයට අයත් සාමාන්‍ය කුටුම්භයක් විසින් පාරිභෝජනය කරන භාණ්ඩ හා සේවා පැසක මුළු පිරිවැය 1952 දී රුපියල් 200 ක් විය. එම භාණ්ඩ පැසෙහි වටිනාකම 2002, 2003 සහ 2004 දී පිළිවෙලින් රුපියල් 6,424 ක්, රුපියල් 6,830 ක් සහ රු. 7,347 ක් විය. කොළඹ පරිභෝගික මිල දර්ශකය අනුව, 1952-2004 කාලය තුළදී ශ්‍රී ලංකාවේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 7.3 ක් වූ බව මින් පිළිබිඹුවේ (සංඛ්‍යා සටහන 2). 2002 දී උද්ධමනය සියයට 9.6ක් විය. මෙය 2003 දී සියයට 6.3 ක් දක්වා පහළ ගිය නමුත් 2004 දී එය සියයට 7.6 ක් දක්වා ඉහළ ගියේය. 2004 වසරේදී උද්ධමනය සියයට 7.6 ක් වුවද (එනම් 2003 වසරේ සිට 2004 දක්වා කාලය තුළදී සමස්ථ මිල මට්ටම සියයට 7.6 කින් ඉහළ යාම), භාණ්ඩ පැසෙහි අඩංගු සමහර භාණ්ඩවල මිල ගණන් අනික් ඒවාට වඩා වැඩියෙන්  2004 දී ඉහළ ගොස් තිබිය හැකි බව මෙහිදී අප මතක තබා ගත යුතුය. භාණ්ඩ පැසෙහි අඩංගු සමහර භාණ්ඩවල මිල ගණන් 2004 දී ඇත්ත වශයෙන්ම පහළ ගොස් තිබීමට ද ඉඩ ඇත.

**සංඛ්‍යා සටහන 2**
**ශ්‍රී ලංකාවේ තෝරාගත් මිල දර්ශකයන්හි උපනතීන්**
**(වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම (%) )**

| කාලච්ජේදය | කො.පා. මි.ද. | ශ්‍රී.ල. පා.මි.ද | තො.මි.ද. | ද.ජා.නි. අවධමනකය |
|---|---|---|---|---|
| 2004 | 7.6 | 7.9 | 12.5 | 9.2 |
| 2003 | 6.3 | 2.6 | 3.1 | 5.0 |
| 2002 | 9.6 | 10.2 | 10.7 | 8.5 |
| 2001-2004 | 9.4 | 8.2 | 9.5 | 8.8 |
| 1991-2000 | 9.7 | | 7.4 | 8.9 |
| 1981-1990 | 12.4 | | 11.7 | 11.7 |
| 1974-1980 | 8.9 | | 15.3 | 12.5 |
| 1961-1970 | 3.0 | | | 1.9 |
| 1952-1960 | 0.4 | | | 2.6 |
| 1952-2004 | 7.3 | | | 7.8 |

සටහන : තො.මි.ද සඳහා 1974 පදනම් වර්ෂය වන අතර, ශ්‍රී.ල.පා.මි.ද. සඳහා 1995-1997 වර්ෂයන්හි සාමාන්‍යය පදනම් වර්ෂය ලෙස සැලකේ.

2 1995/96 පාරිභොගික මූල්‍ය සමීක්ෂණය යටතේ ජනලේඛන හා සඛ්‍යාලේඛන දෙපාර්මේන්තුව මෙම පළාත් දෙක ආවරණය කර නොමැත.

## මිල ස්ථායිතාව වැදගත් වන්නේ ඇයි ?

මිල ස්ථායිතාව පවත්වා ගැනීම වැදගත් වන්නේ එහි ප්‍රතිලාභ ගණනාවක් ඇති හෙයිනි. මිල ස්ථායිතාව පවත්වා නොගතහොත්, උද්ධමනයේ හෝ අවධමනයේ අයහපත් ප්‍රතිවිපාක ඇතිවේ. බොහෝ රටවල අත්දැකීම් තුළින් පැහැදිලි වන්නේ මිල ස්ථායිතාව තුළින් ආර්ථික වර්ධනය දිරි ගැන්වෙන බවයි. එසේ වන්නේ, මිල ස්ථායිතාව තුළින් කුමක් නිපදවිය යුතු ද, කෙසේ නිපදවිය යුතු ද යන්න පිළිබඳව සියලු දෙනාටම වඩාත් නිවරැදි තීරණ ගැනීමටත්, එතුළින් වඩා කාර්යක්ෂමව සම්පත් බෙද හැරීමටත් ඉඩ සැලසෙන බැවිනි. එමෙන්ම මිල ස්ථායිතාව තුළින් ආර්ථිකයේ නියෝජිතයන් විසින් උද්ධමනයෙන් ආරක්ෂා වීමේ උපාය මාර්ගයක් ලෙස හිග සම්පත් වෙනත් කටයුතු සඳහා භාවිත කිරීම ද වළක්වාලයි. මිල ගණන් ස්ථායිව පවතින විට, දිගුකාලීන ඉතිරි කිරීම් සහ ආයෝජන සමග බැඳී ඇති අවදානම සඳහා වන්දි ලෙස ඉතිරි කරන්නෝ සහ ආයෝජකයෝ ඉහළ පොලී අනුපාතික වැනි අවදානම් ආන්තිකයක් ඉල්ලුම් නොකරති. එසේ හෙයින්, අඛණ්ඩව අස්ථායී මිල ගණන් පවතින විට එයින් ඉහළ අවදානම් ආන්තිකයක් සඳහා ඉල්ලුමක් ඇතිකෙරෙන අතර, එයින් දිගුකාලීන ඉතිරිකිරීම් සහ ආයෝජන යන දෙකම අධෛර්යමත් කෙරේ.

මේ අනුව, උද්ධමනය තුළින් මිල සංඥා විකෘති කිරීම, ඉතිරි කිරීම් වල වටිනාකම අඩු කිරීම, ආයෝජන අධෛර්යවත් කිරීම, ප්‍රාග්ධන ප්‍රවාහයන් ඵලදායී ආයෝජනවල සිට ඵලදායී නොවන (වටිනා ලෝහ සහ මූර්ත දේපොළ වැනි) ආයෝජනයන් සඳහා විතැන් කිරීම, ආර්ථික වර්ධනය අඩපණ කිරීම සහ ආර්ථික සැලසුම්කරණය දුෂ්කර කටයුත්තක් බවට පත් කිරීම යනාදී අයහපත් ප්‍රතිවිපාක ගණනාවක් ඇති කෙරේ.

එමෙන්ම ස්ථාවර ආදායම් ලබන්නන්, විශ්‍රාමිකයන් සහ අඩු ආදායම් උපයන්නන් වැනි සමාජයේ දුබල කණ්ඩායම් මත උද්ධමනය නිසා අහිතකර බලපෑම් ඇතිවේ. ඊට හේතුව, උද්ධමනයෙන් ආරක්ෂා වීම සඳහා එබඳු කණ්ඩායම් සතු හැකියාව සීමිත හෙයිනි. උද්ධමනයෙහි පිරිවැය එහි මට්ටම සහ එහි විචල්‍යතාවය අනුව ඉහළ යන අතර, උද්ධමනයේ උපරිම තත්ත්වය වන ජවන උද්ධමනය මගින් අතිශය ඉහළ සමාජ, ආර්ථික, දේශපාලනික පිරිවැයක් ඇතිවී, මහජන අසහනයක් ඇතිවිය හැකි ය. මීට සමාන අයුරින් ම අවධමනයෙහි ද අයහපත් ප්‍රතිවිපාක ගණනාවක් දක්නට හැකිය. එවා නම්, ආයෝජන අධෛර්ය කිරීම, ආර්ථික අඩපණ කිරීම, සේවා වියුක්තිය සහ දුගීභාවය වැඩි කිරීම යනාදියයි. ආර්ථික අවපාතයක් ලෙස හඳුන්වන අවධමනයේ උපරිම අවස්ථාවේදී රටේ ආර්ථික, සමාජ සහ දේශපාලන අස්ථාවරතාවයක් ඇතිවිය හැකිය. අඩු සහ ස්ථායී උද්ධමන තත්ත්වයක් අත්කර ගැනීමත්, පවත්වා ගැනීමත් බොහෝදෙනා අපේක්ෂා කරන ආකාරයට, ආර්ථික සහ සමාජ අරමුණු ඉටුකරගැනීමේ පදනම වේ. විශේෂයෙන් ආයෝජන, නිමැවුම සහ රැකියා අවස්ථාවන්හි තිරසාර වර්ධනයට එය අත්‍යවශ්‍ය සාධකයක් වේ.

උද්ධමනය මෙතරම් අයහපත් දෙයක්නම් අඩු උද්ධමනයක් වෙනුවට ශුන්‍ය උද්ධමන තත්ත්වයක් අප විසින් ඉලක්ක නොකරන්නේ මන්දැයි යමෙකු ප්‍රශ්න කිරීමට ඉඩ ඇත. මේ සඳහා වන පිළිතුර එක් අතකින් උද්ධමනය මැනීම හා සම්බන්ධය. "මනින ලද" උද්ධමනය යම් ප්‍රමාණයකට "සත්‍ය" උද්ධමනයට වඩා වැඩි විය හැකිය. උද්ධමනය නිවැරදි ලෙස ඇස්තමේන්තු කරනු පිණිස භාණ්ඩ හා සේවාවන්හි ගුණාත්මක තත්ත්වය නොවෙනස්ව පවත්වාගෙන ඒවායෙහි මිල වෙනස් වීම් පමණක් වාර්තා කළ යුතුය. කෙසේ වුවත්, එය සෑම අවස්ථාවකම කළ නොහැකි අතර, ඇතැම් වාර්තා කරන ලද මිල ඉහළ යාම් තුළින් භාණ්ඩ හා සේවාවන්ට අදාළ අතිරේක ලක්ෂණ හෝ ඉහළ ගුණාත්මක තත්ත්වයන් නිරූපණය කිරීමට ඉඩ ඇත. එසේම, ඇතැම් මිල ගණන් සහ වේතන පහළ වැටීම සඳහා අඩු නැඹුරුතාවක් දක්වන හෙයින්, සාපේක්ෂ මිල ගණන් අතර වෙනසක් ඇතිකිරීම සඳහා යම් සුළු ප්‍රමාණයක හෝ උද්ධමනයක් පැවතීම අවශ්‍ය වේ. එබැවින්, ශුන්‍ය උද්ධමනයක් ඉලක්ක කිරීම තුළින් අනපේක්ෂිතව ම අවධමනකාරී තත්ත්වයක් දක්වා විතැන් වීමේ අවදානමක් පවතී. එමෙන් ම , වෙළඳපොළ තුළ තීරණය කෙරෙනු ලබන නාමික පොලී අනුපාතිකය සෘණ විය නොහැකි හෙයින්, ආර්ථික අවපාතයක් වැනි අවස්ථාවකදී ආර්ථිකය දිරි ගැන්වීම සඳහා සෘණ මූර්ත පොලී අනුපාතිකයක් තිබීම අවශ්‍ය වන්නාක් මෙන්, එවන් අහිතකර තත්ත්වයන්හි දී යම් උද්ධමනයක් පැවැතීම තුළින් කිසියම් ආරක්ෂාවක් ලැබීමට ඉඩ තිබේ. මේ හෙයින් ශුන්‍ය උද්ධමනයක් අරමුණක් වශයෙන් ඉලක්ක කිරීම අවශ්‍ය නොවන අතර, දිගුකාලීන වර්ධන අපේක්ෂාවන්ට හානියක් නොවන ලෙස ශුන්‍යයට කිට්ටු උද්ධමනයක් පවත්වා ගැනීම දරාගත හැකි දෙයක් විය හැකිය. මේ අනුව, සාරාංශ වශයෙන් කිව හැක්කේ උද්ධමනය හා අවධමනය යන දෙකෙහි ම අයහපත් ආර්ථික, සමාජ, දේශපාලන ප්‍රතිවිපාක ඇති අතර, මිල ස්ථායිතාව තුළින් සෑම දෙනාගේම ජීවන තත්ත්වය ඉහළ නැංවීම පිණිස හේතුවන හිතකර පරිසරයක් සැපයෙන බවයි.

## මිළ ස්ථායීතාවට බලපාන සාධක කවරේ ද ?

නිදහස් වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක, ඉල්ලුම් හා සැපයුම් තත්වයන් හා එහි වෙනස්වීම් පිළිබඳ සංඥා සැපයෙන්නේ මිල ගණන් තුළිනි. කෙටි කාලයේ දී ඉල්ලුමට හා සැපයුමට බලපාන සාධක විශාල සංඛ්‍යාවක් පවතින අතර, කාලගුණය, සමාජ හා සංස්කෘතික සිදුවීම්, ජනතාවගේ ක්‍රය ශක්තිය, පාරිභෝගික වරණයන්, නවෝත්පාදන, සහ ඵලදායීතාව එයින් කිහිපයකි. සාමාන්‍යයෙන් අස්වනු නෙලන සමයන්හි දී සැපයුම ඉහළ යන හෙයින් සහල් මිල පහළ වැටෙන බවද , නියං කාලයට පසුව නිමැවුම පහළ වැටෙන හෙයින් එළවළු මිල ගණන් ඉහළ යන බව ද අපි දනිමු. මේ ආකාරයෙන් ම සාමාන්‍යයෙන් අලුත් අවුරුදු , නත්තල් වැනි උත්සව සමයන්හි දී සැපයුමට වඩා ඉල්ලුම ඉහළ යන හෙයින් ආහාර වර්ග වල මිල ගණන් ඉහළ යාමේ නැඹුරුවක් පවතී. කෙසේ වුවද , කාලීන සාධක මත සිදුවන මිල ගණන් වෙනස්වීම් බොහෙවින් තාවකාලික වන අතර, ඉතා කෙටි කලක් තුළදී මිල ගණන් යළිත් යථා තත්ත්වයට පත්වේ.

මහජනයා සතුව වැයකිරීම පිණිස මුදල් ඇතිවිට භාණ්ඩ හා සේවා සඳහා ඔවුහු වැඩිපුර ඉල්ලුම් කරති. ඉල්ලුම ඉහළ යන වේගයට සමාන වේගයකින් භාණ්ඩ හා සේවා සැපයුම ඉහළ නොයන්නේ නම්, මුදල් සැපයුම වැඩිවීමත් සමග සමස්ථ ඉල්ලුම වැඩිවී මිල ගණන් ඉහළ යයි. කෙසේ වුව ද, පවත්නා යෙදවුම් ප්‍රමාණය සහ තාක්ෂණික හැකියාවන් වැනි සීමාවන් සැපයුම වැඩිකිරීම සඳහා පවතී. මේ හෙයින්, භාණ්ඩ හා සේවා සැපයුම් ප්‍රසාරණයට වඩා වැඩිපුර මුදල් ප්‍රමාණයක් මහජනයා අත පැවතීම උද්ධමනය සඳහා බලපාන මූලිකම ඉල්ලුම් පාර්ශ්වයේ සාධකය වේ. මෙවැනි තත්ත්වයක් පොදුවේ "භාණ්ඩ ස්වල්පයක් පසුපස හඹා යන මුදල් කන්දරාවක්" ලෙස හැඳින්වේ. මේ ආකාරයෙන් ම, පුද්ගලයන් අත වැයකිරීම සඳහා අඩු මුදල් ප්‍රමාණයක් පවතින විට ඉල්ලුමේ හිගය විසින් නිෂ්පාදනය



Final Proof 2006. 06. 19

**රූප සටහන 1 - ශ්‍රී ලංකාවේ පුළුල් මුදල් සැපයුමෙහි (M2) වර්ධනය සහ උද්ධමනය: (1955 -2004)**




**රූප සටහන 2 - ශ්‍රී ලංකාවේ පාරිභෝගික මිල දර්ශකයන්හි වාර්ෂික වෙනසවීම්: 1999 දෙසැම්බර් සිට 2005 ජුලි**




**සංඛ්‍යා සටහන 3**
**පාරිභෝගික මිල උද්ධමනය (වාර්ෂික සාමාන්‍යය)**

සියයට

| | 1980 | 1985 | 1990 | 1995 | 2000 | 2004 |
|---|---|---|---|---|---|---|
| ඇමරිකා එ.ජ. | 13.5 | 3.6 | 5.4 | 2.8 | 3.4 | 2.7 |
| ජපානය | 7.8 | 2.0 | 3.1 | -0.1 | -0.7 | 0.0 |
| පෝලන්තය | 9.7 | 11.5 | 555.4 | 28.1 | 10.1 | 3.6 |
| ආර්ජන්ටිනාව | 100.8 | 672.2 | 2314.0 | 3.4 | -0.9 | 4.4 |
| බොලීවියාව | 47.2 | 11,749.6 | 17.1 | 10.2 | 4.6 | 4.4 |
| පේරු | 59.2 | 163.4 | 7481.7 | 11.1 | 3.8 | 3.7 |
| ඉන්දියාව | 11.4 | 5.6 | 9.0 | 10.2 | 4.0 | 3.8 |
| සිංගප්පූරුව | 8.5 | 0.5 | 3.5 | 1.7 | 1.4 | 1.7 |
| පකිස්ථානය | 11.9 | 5.6 | 9.1 | 12.3 | 4.4 | 7.4 |
| තුර්කිය | 110.2 | 45.0 | 60.3 | 88.1 | 54.9 | 8.6 |
| ශ්‍රී ලංකාව | 26.2 | 1.5 | 21.5 | 7.7 | 6.2 | 7.6 |

මූලය: International Financial Statistics

අධෛර්ය කෙරෙන අතර එමගින් අඩු ආර්ථික වර්ධනයක් සහ ඉහළ සේවා වියුක්තියක් ඇති කෙරේ. එමෙන්ම, අඩු අස්වැන්න හේතුවෙන් ආහාර මිල ගණන් ඉහළ යාම හෝ බනිජ තෙල් මිල ඉහළ යාම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම වැනි සාධක නිසා සාමාන්‍ය මිල මට්ටම එක්වරම ඉහළයාම සිදුවිය හැකිය. කෙසේ වුවද, එබඳු මිල ගණන් ඉහළ යාමකින් සාමාන්‍ය මිල මට්ටමෙහි තාවකාලික ඉහළ යාමක් පමණක් සිදුවිය හැකිය. එය උද්ධමනයක් බවට පත්වීමට නම් මුදල් සැපයුමේ ප්‍රසාරණය තුළින් එය තිව්‍ර විය යුතුය. මේ අනුව, දිගුකාලීන උද්ධමනය ඇතිවන්නේ මූර්ත ආර්ථික වර්ධනයට සාපේක්‍ෂව අධික මූල්‍ය ප්‍රසාරණය තුළින් බවට ආර්ථික විද්‍යාඥයෝ එකග වෙති. නොබෙල් ත්‍යාගලාභී ආර්ථික විද්‍යාඥයෙකු වූ මිල්ටන් ෆ්‍රීඩ්මන් මෙය වඩාත් තර්කානුකූල ලෙස පැහැදිලි කොට ඇත්තේ, උද්ධමනය වනාහි සැමවිටම සහ සැම තැනකදී ම මුදල්මය ප්‍රපංචයකි් යනුවෙනි. වෙනත් ආකාරයකින් කිවහොත්, මුදල් සැපයුමේ දිගුකාලීන ප්‍රසාරණයක් නොමැතිව උද්ධමනයක් ඇතිවිය නොහැකි බවයි.

## උද්ධමනය පාලනය කළ හැකි ක්‍රියාමාර්ග කවරේ ද ?

උද්ධමනයට බලපාන සාධක ගණනාවක් පවතින හෙයින්, විශේෂයෙන් කෙටි කාලයේ දී උද්ධමනය පාලනය කිරීම සඳහා ගතයුතු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග උද්ධමනයට හේතු වූ ප්‍රභවය මත රඳා පවතී. පොදුවේ පිළිගනු ලබන්නේ කෙටි කාලයේ දී ප්‍රධාන වශයෙන් සැපයුම් පාර්ශ්වයේ සාධක හෝ ව්‍යුහාත්මක ගැටලු තුළින් උද්ධමනය ඇතිවන බවයි. එබැවින්, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්හි අවධානය යොමු විය යුත්තේ එබඳු ගැටලු සඳහා මෙන්ම නිෂ්පාදනය පුළුල් කිරීම සඳහා ය. ආර්ථික වර්ධනය දිරි ගැන්වීමේ දී ඵලදායිතාව වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වන අතර, එයට හේතුව වේගවත් වර්ධනය තුළින් ජනිත වන ඉහළ ආදායම තුළින් සහ නිෂ්පාදන පිරිවැය ඉහළ නංවන පිරිවැයෙන් තල්ලුවන සාධක තුළින් ඇතිවිය හැකි උද්ධමනකාරී පීඩන වැළැක්වීම අවශ්‍ය බැවිනි. කෙසේ වුවද , දිගුකාලයේ දී , උද්ධමනය මූලික වශයෙන් මුදල්මය ප්‍රපංචයක් වන හෙයින්, උද්ධමනය පාලනය කිරීමෙහිලා (එනම් මිල ස්ථායිතාව ළඟා කර ගැනීම හා පවත්වා ගැනීම) සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් මූල්‍ය ප්‍රසාරණය යෝග්‍ය මට්ටමකට ගෙන ඒම සඳහා මහ බැංකුවලට ප්‍රමුඛ කාර්ය භාරයක් හිමිවේ. බොහොමයක් රටවල අත්දැකීම් තුළින් පැහැදිලි වී ඇත්තේ, මිල පාලනය තුළින් උද්ධමනය පාලනය කිරීමට උත්සාහ කිරීම තිරසාර විසඳුමක් නොවන අතර, තමන්ට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා දිගු පෝලිම් වල රැඳී සිටීමටත්, ඇතැම් විට අල්ලස් හෝ ගාස්තු ගෙවීමටත් සිදුවීම නිසා ඉහළ මිලක් ගෙවීමට මහජනයාට සිදුවේ. තවදුරටත්, භාණ්ඩ හිගය තුළින් ඉහළ මිල ගණන් ගෙවීමට සිදුවන කළුකඩ වෙළෙඳපොළක් නිර්මාණය වීම ද සිදුවේ. මේවා ආර්ථිකයට සිදුවන සමස්ථ අලාභයන් (මෙය මලානික පිරිවැය–dead-weight loss) ලෙස හැඳින්වේ) වන අතර, ඒවා දිගුකාලීන ආර්ථික වර්ධනය ද අඩපණ කරයි.

එනිසා අධික මුදල් ප්‍රසාරණය තුළින් ඇතිවන උද්ධමනය, මුදල් ප්‍රසාරණය පාලනය කිරීම තුළින් තිරසාර ලෙස මැඩපැවැත්විය යුතු අතර, විශේෂයෙන්ම ඵලදයිතාවය වර්ධනය කිරීම තුළින් රටේ නිෂ්පාදනය ඉහළ දැමිය යුතුවේ. මෙම කාර්යයයේදී, අනුපූරක ප්‍රතිපත්ති වශයෙන් වඩාත් යෝග්‍ය අයවැය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම, මිල ස්තායිතාවය ළඟා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙය විශේෂයෙන් වැදගත් වන්නේ ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ දියුණුවෙමින් පවතින රටවල දැකිය හැකි පරිදි, රජය විසින් අධික ලෙස ණය ගැනීම හේතුවෙන් (එනම් ඉහළ අයවැය හිඟයන්ගේ ප්‍රතිඵලයක් ලෙස) මුදල් අධික ලෙස ප්‍රසාරණය වීම සිදුවන බැවිනි.



Final Proof 2006. 06. 19

## මුදල් යනු කවරේ ද ?

මුදල් සැපයුමේ සිදුවන වෙනස්වීම් මිල ස්ථායිතාවයට බලපාන මූලික ම සාධකය බව අප ඉහතදී දුටුවෙමු. එබැවින්, මුදල් යනු කවරේ ද යන්න සහ එහි සැපයුම ඉහළ/පහළ යාම සිදුවන අයුරු පිළිබඳව දැනගැනීම වැදගත් වේ. පොදු ජනතාව අවබෝධ කරගෙන ඇති පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන ලද ව්‍යවහාරයේ පවතින කාසි සහ නෝට්ටු වලින් මුදල් සමන්විත වේ. නමුත් මෙයට මුදල් ලෙස ක්‍රියාත්මක වන සියළුම වටිනා ද්‍රව්‍ය ඇතුළත් නොවේ. මුදල් යනු අපට එදිනෙදා ජීවිතයේ දී හමුවන අත්‍යවශ්‍ය දෙයකි. වැඩ කිරීමෙන් මුදල් උපයා ගත හැකි අතර එය අපට අවශ්‍ය දේවල් වෙනුවෙන් වැය කිරීම, සඳහා හෝ අනාගතයේදී වැය කිරීම සඳහා ඉතිරිකිරීම සඳහා හෝ භාවිතා කළහැකි අතර, හදිසි අවශ්‍යතා සඳහා ණයට ගැනීම ද කළ හැකිය. කෙසේ වෙතත්, මුදල් හුදෙක් මුදල් වශයෙන් පමණක් ප්‍රයෝජනවත් දෙයක් නොවන අතර, මුදලක වටිනාකම රඳාපවතින්නේ එමගින් මිලදී ගත හැකි දේවල් මතය. රුපියලක් සැමවිට ම රුපියලක් වන අතර, එහි හුදු නාමය වෙනස් නොවේ. නමුත් රුපියලට මිලදී ගත හැක්කේ, මොනවාද යන්නත්, කොපමණක් ද යන්නත් මිල මට්ටම වෙනස්වීම අනුව වෙනස් වේ. එබැවින්, මුදල් සැපයුම මිල මට්ටම කෙරෙහිත්, මිල මට්ටම මුදලේ වටිනාකම කෙරෙහිත් බලපායි.

ආර්ථික විද්‍යාවේදී, මුදල් යනු මහ බැංකුවෙන් නිකුත් කරන ලද ව්‍යවහාරයේ පවතින කාසි සහ නෝට්ටු පමණක්ම නොවේ. භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට අවශ්‍ය ක්‍රය ශක්තිය තැන්පත්කරුට ලබාදෙන බැවින් මහජනතාව විසින් වානිජ බැංකු වල පවත්වාගෙන යන තැන්පතු ද මෙයට ඇතුලත් වේ. සාමාන්‍යයෙන්, ශ්‍රී ලංකාවේ මූල්‍ය වර්ධනයන් විශ්ලේෂණය කිරීමේදී මූල්‍ය සමස්තයන් 3 ක් නිර්වචනය කර ඇත[3].

පළමු මූල්‍ය සමස්තය සංචිත මුදල් යනුවෙන් හඳුන්වනු ලබයි. එය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද ව්‍යවහාර මුදල් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන වානිජ බැංකු තැන්පතු වල එකතුවයි. මෙය සංචිත මුදල්, හෝ පදනම් මුදල් හෝ බලගතු මුදල් (High Powered Money) ලෙස හඳුන්වනු ලබන්නේ ඒවා පදනම් කරගෙන තැන්පතු නිර්මාණය කිරීමේ හැකියාව වානිජ බැංකු වලට ඇති බැවින් සහ ඒවා මුදල් සැපයුමේ පුළුල් අර්ථදැක්වීමේ සංඝටක වන බැවිනි.

දෙවන මූල්‍ය සමස්තය, පටු මුදල් ලෙස හඳුන්වන අතර, එය මහජනතාව අතැති ව්‍යවහාරයේ පවතින මුදල් වල සහ මහජනතාව විසින් වානිජ බැංකු වල පවත්වාගෙන යනු ලබන ඉල්ලුම් තැන්පතු වල එකතුවයි. තුන්වන මූල්‍ය සමස්තය, පුළුල් මුදල් නමින් හැඳින්වෙන අතර, එය මහජනතාව සතුව ඇති ව්‍යවහාරයේ පවතින මුදල් සහ මහජනතාව විසින් වානිජ බැංකු වල පවත්වාගෙන යනු ලබන සියළුම තැන්පතු වර්ගවල එකතුව ලෙස අර්ථ දක්වා ඇත. බොහොමයක් අධ්‍යයනයන් මගින් පෙන්වා දී ඇති පරිදි, මුදල් සැපයුම සහ සාමාන්‍ය මිල මට්ටම අතර සම්බන්ධය සෙවීමේ දී වඩාත් උචිත මූල්‍ය සමස්තය වන්නේ ඉහතින් අර්ථ දක්වන ලද පුළුල් මුදල් සැපයුමයි.

## මූල්‍ය ප්‍රසාරණයට බලපාන මූලික සාධක මොනවා ද ?

ශ්‍රී ලංකාවේ මූලික මුදල් සැපයුම් ප්‍රභවය වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවයි. මුදල් ලෙස නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරක්ෂිතාගාරය තුළ මුද්‍රිත කාසි සහ මුදල් නෝට්ටු තොගයක් පවතී. කෙසේ වෙතත්, මෙම කාසි හා නෝට්ටු මුදල් බවට පත්වන්නේ මහජනතාවගේ වත්කමක් බවට පත්වීමෙන් අනතුරුවයි.

ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ආර්ථිකයට මුදල් මුදාහරින ප්‍රධාන මාර්ග දෙකක් පවතී. මින් පළමු මාර්ගය වන්නේ රජයට හෝ/සහ වානිජ බැංකු වලට ණය දීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය වත්කම් අත්කර ගැනීමයි. රජයේ වියදම් එහි ආදායමට වඩා වැඩි වන විට, රජයේ අයවැය හිඟයක් ඇතිවන අතර, එය මූල්‍යනය කිරීම සඳහා ණයට ගැනීම කළ යුතුයි. රජයට, ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු විවිධ මූලාශ්‍ර වලින් ණය ගැනීම කළ හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ණය ගැනීමේදී එහි සුරක්ෂිතාගාර තුළ ඇති කාසි සහ මුදල් නෝට්ටු සංසරණයට එකතුවීම සිදුවේ. රජය මෙම මුදල් සිය වියදම් පියවීමට යොදගත් විට ඒවා මහජනතාවගේ සහ බැංකු පද්ධතියේ වත්කම් බවට පත්වේ. අනෙක් අතට, රජය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගත් ණය පියවීමේ දී ආර්ථිකයේ ඇති මුදල් නැවතත් මහ බැංකුවේ සුරක්ෂිතාගාර තුළට පැමිණ ඒවා අක්‍රීය ආකාරයේ මුද්‍රිත කාසි සහ නෝට්ටු බවට පත්වේ. වානිජ බැංකු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ණය ගැනීමේදී සහ වානිජ බැංකු සිය ආයෝජන කලඹේ පවතින භාණ්ඩාගාර බිල්පත් වැනි දේශීය වත්කම් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීම තුළින් මුදල් සැපයුම ප්‍රසාරණය වන අතර, වානිජ බැංකු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබාගත් ණය පියවීමේදී සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති භාණ්ඩාගාර බිල්පත් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන ලද සුරැකුම්පත් මිලට ගැනීමේදී මුදල් සැපයුම සංකෝචනය වේ.

අනෙක් මාර්ගය වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය වෙළෙඳපොළ තුළ කරනු ලබන ගනුදෙනු ය. ශ්‍රී ලංකා මහ බැංකුව රජයෙන් හෝ වානිජ බැංකු වලින් විදේශ විනිමය මිලදී ගත් විට රුපියල් නෝට්ටු සහ කාසි නිකුත් කරන බැවින්, මුදල් සැපයුම ප්‍රසාරණය වේ. අනෙක් අතට, ශ්‍රී ලංකා මහ බැංකුව එය සතු විදේශ විනිමය රජයට හෝ වානිජ බැංකු වලට විකිණූ විට මුදල් සැපයුම සංකෝචනය කරමින් මුදල් නැවතත් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතට ගලා එනු ලැබේ.

වානිජ බැංකු සිය සේවා දායකයන් සමග සිදුකරනු ලබන කටයුතු වලින් ඇතිවන ණය සහ තැන්පතු නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ද මුදල් සැපයුම වෙනස් කිරීමට දායක වේ. සමස්තයක් ලෙස තැන්පතුකරුවන් වානිජ බැංකුවල ඇති ඔවුන්ගේ තැන්පතු වලින් ආපසු ලබාගන්නේ සුළු ප්‍රමාණයක් බැවින්, වානිජ බැංකුවලට හුදෙක් තැන්පතු නිර්මාණය කිරීම තුළින් ණය ලබාදීම සිදුකළ හැක. මෙම ක්‍රියාවලියේ දී, වානිජ බැංකු අත්කරගන්නා මූල්‍ය වත්කම් (දේශීය සහ විදේශීය) සහ පෞද්ගලික අංශයට සහ රාජ්‍ය අංශයට (රාජ්‍ය සහ රාජ්‍ය සංස්ථා) දෙනුලබන ණය ප්‍රසාරණය වීම, මුදල් සැපයුමට බලපාන ප්‍රධාන සාධකයන් වේ. ඒ අනුව, දේශීය වෙළෙඳපොළේ මූල්‍ය වත්කම් (ප්‍රධාන වශයෙන්

---

3 (i) $RM = C+CD$, (ii) $M1 = C_p + DD_p$, (iii) $M2 = C_p+DD_p+SFD_p$

එනම්

| | | |
|---|---|---|
| $C$ | = | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ව්‍යවහාරයේ පවතින මුදල් |
| $CD$ | = | ශ්‍රී ලංකා මහ බැංකුවේ පවතින වාණිජ බැංකු තැන්පතු |
| $C_p$ | = | මහජනයා අතැති මුදල් |
| $DD_p$ | = | වාණිජ බැංකුවල ඇති මහජනතාවගේ ඉල්ලුම් තැන්පතු |
| $M1$ | = | පටු මුදල් සැපයුම |
| $M2$ | = | පුළුල් මුදල් සැපයුම |
| $RM$ | = | සංචිත මුදල් |
| $SFD_p$ | = | වාණිජ බැංකුවල පවත්වාගෙන යන මහජනතාවගේ ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු |

භාණ්ඩාගාර බිල්පත්) විකිණීම සහ මිලදී ගැනීම තුළින් අරමුදල් වල පිරිවැය හෝ/සහ මුදල් සැපයුම වෙනස් කිරීම් තුළින් මූල්‍ය ප්‍රසාරණයට බලපෑම් ඇතිකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ඇත.

## මූල්‍ය ස්ථායිතාවය ළඟාකරගැනීම සඳහා මුදල් ප්‍රතිපත්තිය භාවිතා කරන අයුරු

මුදල් ප්‍රතිපත්තිය යනු මුදලේ සැපයුමට (ණය) සහ මුදලේ මිලට (පොලී අනුපාතික) බලපෑම් කිරීම තුළින් මූල්‍ය ස්ථායිතාවය ළඟාකරගැනීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගයන්ය. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී භාවිතා කළ හැකි මූල්‍ය උපකරණ රාශියක් මහ බැංකුවකට ඇත. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය සහ විවට වෙළෙඳපොළ කටයුතු වඩාත් බහුලව භාවිතා කරන උපකරණ ලෙස දැක්විය හැක. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය යටතේ, වානිජ බැංකුවල තැන්පතු වලින් නියමිත ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ තබන ලෙසට නියෝග පැනවීමේ හැකියාව මහ බැංකුව සතුව ඇත. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වෙනස් කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට වානිජ බැංකුවල ණය මැවීමේ ක්‍රියාවලියට බලපෑම් කිරීමේ හැකියාව ඇති අතර, එමගින් පුළුල් මුදල් සැපයුම සහ වෙළෙඳපොළ පොලී අනුපාතිකවලට බලපෑම් කිරීමේ හැකියාව ලැබේ. විවට වෙළෙඳපොළ කටයුතු යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව වානිජ බැංකු සමග සිදුකරන ගනුදෙනු සහ/හෝ භාණ්ඩාගාර බිල්පත් හා ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් ගනුදෙනු කිරීමේදී අදාල වන ප්‍රතිපත්තිමය පොලී අනුපාතික වෙනස් කිරීම තුළින්, මුදල් සැපයුමට සහ වෙළෙඳපොළ පොලී අනුපාතික වලට බලපෑම් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ඇත.

මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය වෙනස් කිරීම, ආර්ථිකයේ සාමාන්‍ය මිල මට්ටමට සහ නිෂ්පාදිතයට බලපෑම් කිරීමේ ක්‍රියාවලිය මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය ලෙස හඳුන්වනු ලබයි. මුදල් ප්‍රතිපත්ති වෙනස්වීම් ආර්ථිකයට සම්ප්‍රේෂණය වන මාර්ග ගණනාවක් ඇත. (රූපසටහන1) මෙම මාර්ග පහත දැක්වෙන අයුරින් බෙද දැක්විය හැක. (i) පොලී අනුපාතික මාර්ගය (පොලී අනුපාතික වෙනස්වීම තුළින් ආර්ථිකයට බලපෑම් ඇතිවීම) (ii) ණය මාර්ගය (ණය සැපයුමේ වෙනස්කම් තුළින් ආර්ථිකයට බලපෑම් ඇතිවීම) (iii) විදේශ විනිමය අනුපාතික මාර්ගය (විදේශ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් තුළින් ආර්ථිකයට බලපෑම් ඇතිවීම) සහ (iv) වත්කම් මාර්ගය (වත්කම් වල මිල ගණන් වෙනස්වීම මගින් ආර්ථිකයට බලපෑම් ඇති වීම).

මෙම මාර්ගයන් අතුරෙන්, විශේෂයෙන් දියුණුවෙමින් පවතින රටවල වැඩි අවධානය යොමු වී ඇත්තේ පොලී අනුපාතික සහ ණය මාර්ග කෙරෙහි ය. එසේම, මෙහිදී දැක්විය යුතු තවත් වැදගත් කරුණක් වන්නේ ප්‍රතිපත්තිමය උපකරණ (ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය හෝ විවට වෙළෙඳ කටයුතු) වෙනස් කිරීම තුළින් සිදුවන මුදල් ප්‍රතිපත්තියේ වෙනස්වීම්වල බලපෑම් අතරමැදි ඉලක්ක (පුළුල් මුදල් සපැයුම වැනි) සහ ඉන් අනතුරුව අවසාන ඉලක්ක (මිල සහ නිෂ්පාදනය) දක්වා ළඟාවීමට වසර 2 කට ආසන්න කාල පමාවක් ගතවන බවයි.

ශ්‍රී ලංකාවේ, මුදල් ප්‍රතිපත්තිය සැකසීමේ සහ ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියා කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටවනු ලැබූ හා එය ක්‍රියාත්මක වන නීතිය වන මුදල් නීති පනත මගින්, මිල ස්ථායිතාවය ළඟා කරගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය කළමණාකරණ කිරීම සඳහා විශාල පරාසයකින් යුතු ප්‍රතිපත්තිමය උපකරණ රාශියක් හඳුන්වා දී ඇත[4]. ශ්‍රී ලංකා මහ බැංකුව මේ සඳහා, තමන් විසින් භාවිතා කළහැකි මෙහෙයුම් ඉලක්කය ලෙස සංචිත මුදල් සහ අතරමැදි මුදල් ප්‍රතිපත්ති ඉලක්කය ලෙස පුළුල් මුදල් සැපයුම යොදගත්, මුදල් ඉලක්කගත රාමුවක් යොදගනී[5]. මහ බැංකුව මුදල් කළමනාකරණය සඳහා වෙළෙඳපොළ මත පදනම් වු ප්‍රතිපත්තිමය උපකරණ වෙතට ක්‍රම ක්‍රමයෙන් යොමුවී තිබෙන අතර, වර්තමානයේදී විවට වෙළෙඳ කටයුතු කෙරේ වඩාත් නැඹුරු වී ඇත.

ශ්‍රී ලංකාවේ, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය මුදල් ප්‍රතිපත්ති උපකරණයක් ලෙස භාවිතා කර ඇති අතර වර්තමානයේදී එම අනුපාතය සියළුම වර්ගයේ රුපියල් තැන්පතු වලින් සියයට 10 කි. කෙසේ වෙතත්, විවට වෙළෙඳ කටයුතු කෙරෙහි යොමුවීම වැඩිවීමත් සමග ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය කෙරෙහි ඇති නැඹුරුව අඩු වී ඇත. වර්තමානයේ පවතින විවට වෙළෙඳ කටයුතු අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව තම ප්‍රති මිලදී ගැනීමේ හා ප්‍රති විකිණීමේ අනුපාතික වෙනස්කිරීම මගින් වෙළෙඳපොළට සිය මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ සංඥා නිකුත් කරන අතරම, නියමිත සංචිත මුදල් ඉලක්කයට අනුකූල වන පරිදි වෙළෙඳපොළ රුපියල් ද්‍රවශීලතාවය පවත්වා ගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් අලෙවිකිරීම සහ/හෝ මිලදී ගැනීම ද සිදුකරයි. ප්‍රතිපත්තිමය අනුපාතික (ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතවිකිණීමේ අනුපාත) අඩු කිරීම තුළින් සහ / හෝ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම තුළින්, ශ්‍රී ලංකා මහ බැංකුවට මුදල් සැපයුම ප්‍රසාරණය කිරීමට සහ වෙළෙඳපොළ පොලී අනුපාතික පහළ දැමීමට හැකිවෙන ලෙස මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කළ හැකිය. එසේම ප්‍රතිපත්ති අනුපාතික ඉහළ දැමීම, සහ/හෝ මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් විකිණීම හෝ මහ බැංකු සුරැකුම් පත් නිකුත් කිරීම තුළින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකිවේ. මෙම විවට වෙළෙඳ කටයුතු මගින් ඒකෂණ මුදල් වෙළෙඳපොළ (වානිජ බැංකු අතර මුදල් වෙළෙඳපොළ) පොලී අනුපාතික වලට සහ බැංකු පද්ධතියේ පවතින රුපියල් ද්‍රවශීලතාවයට ක්ෂණික බලපෑමක් ඇතිකරන අතර, එයින් ඔවුන්ගේ ණය දීමේ කටයුතු වලට බලපෑමක් ඇති කෙරේ.

ඒකෂණ මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතික සහ/හෝ රුපියල් ද්‍රවශීලතාවයේ වෙනස්වීම් කෙටි කාලයක් තුළදී භාණ්ඩාගාර බිල්පත් ඵලද අනුපාතික සහ වානිජ බැංකුවල ප්‍රමුඛ ණය දෙන පොලී අනුපාතික වෙනස් වීම කෙරේ බලපායි.

මෙම වෙනස්වීම් යම්කාල පමාවකින් පසුව වානිජ බැංකුවල සාමාන්‍ය තැන්පතු සහ ණයදීමේ අනුපාතික, භාණ්ඩාගාර බැඳුම්කර ඵලද අනුපාතික සහ බැංකු පද්ධතියේ ණය ප්‍රසාරණය ආදිය කෙරේ බලපෑම් ඇතිකරන අතර, එය ණය ලබාගන්නන්ගේ (පරිභෝජනයට සහ ආයෝජනයට) සහ ඉතිරිකරන්නන්ගේ තීරණ වලට බලපෑම් ඇතිකරයි. විනිමය අනුපාතිකයට සහ කොටස් හා මූර්ත දේපළ යනාදී වත්කම් මිල කෙරෙහිද මෙම වෙනස්වීම් බලපෑ හැකිය. අවසානයේදී මෙම සියළු වෙනස්කම් සමස්ත ඉල්ලුමට බලපෑම් ඇතිකරමින් ආර්ථිකයේ නිමැවුමට සහ සාමාන්‍ය මිල මට්ටමට බලපෑම් ඇතිකරයි.

සාරාංශයක් ලෙස ගත් කළ උද්ධමනය (හෝ අවධමනය) ආර්ථික, සමාජයීය සහ දේශපාලනමය වශයෙන් අහිතකර බලපෑම් ඇති කරන අතර, ආර්ථිකයේ මිල ස්ථායිතාවය පවත්වා ගැනීම තුළින්

---

4.මුදල් නීති පනතේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු වන්නේ (i) ආර්ථික හා මිල ස්ථායිතාවය සහ (ii) මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවයයි,

5."ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති අරමුණු සහ ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුව" යන මැයෙන් ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ මේ පිළිබඳ වැඩි විස්තර දක්වා ඇත.



Final Proof 2006. 06. 19

**රූප සටහන 1 - මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය**




වාසි රැසක්ම ළඟාකර ගත හැකිය. දිගු කාලීන වශයෙන් අධික මුදල් සැපයුම උද්ධමනයට හේතු වුවද, කෙටිකාලීනව මිල මත පීඩනය ඇතිකළ හැකි තවත් කරුණු ගණනාවක් ඇත. එබැවින්, මුදල් ප්‍රතිපත්තියේ අරමුණු අතරින් වඩාත් වැදගත් අරමුණක් වන්නේ උද්ධමනය පාලනය කිරීම හෙවත් මිල ස්ථායිතාවය පවත්වා ගැනීමයි.

කෙසේ වෙතත්, අපි දැනගත යුතු වැදගත් කරුණක් වන්නේ මුදල් ප්‍රතිපත්තිය අනෙකුත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති වලින් තොරව හුදකලාව ක්‍රියාත්මක කළ නොහැකි බවත්, එයට පමණක් මිල ස්ථායිතාවය පවත්වාගත නොහැකි බවත් ය. විශේෂයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති (එනම් බදු, වියදම් සහ අයවැය මූල්‍යනය සඳහා වූ රාජ්‍ය ප්‍රතිපත්ති) මුදල් ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාත්මක කිරීම තුළින් මිල ස්ථායිතාවය වඩා සාර්ථකව ළඟා කර ගත හැකිය. ආදයම් ප්‍රතිපත්ති, එනම් ඵලදායීතාව වැඩිවීම් සමග සම්බන්ධ කරන්නාවූ වැටුප් ප්‍රතිපත්ති ද අනුගමනය කළ යුතුය. තවද , ශ්‍රී ලංකාව වැනි දියුණුවෙමින් පවතින රටවල ඇති වෙනත් ව්‍යුහාත්මක ගැටලු (එනම් නිෂ්පාදනය, භූමිය, ශ්‍රමය සහ ප්‍රාග්ධන වෙළෙඳ පොළ තුළ පවතින අකාර්යක්ෂමතා ඵලදායිතා වර්ධනයට බාධා පමුණුවන අතර, අධික නාස්තියට හේතුවේ.) ඇති අතර , අවම සහ ස්ථායි උද්ධමනයක් ,එනම් මිල ස්ථායිතාවයක්, පවත්වා ගැනීමට අවශ්‍ය පසුබිම් නිර්මාණය කිරීම සඳහා එම ගැටලු නිරාකරණය කිරීම ද කළ යුතුවේ.

## ආශ්‍රිත මූලික යෙදුම්

| | |
|---|---|
| **මූලික උද්ධමනය** | - මිල විශාල විචල්‍යතාවයන්ට බඳුන්වන යම් අයිතමයන් ඉවත් කිරීමෙන් පසු ගණනය කරන ලද, උද්ධමනයේ උපනතිය පෙන්නුම් කරන මිනුමකි. |
| **අවධමනය** | - සාමාන්‍ය මිල මට්ටම පහළ බැසීම. |
| **නිර්-උද්ධමනය** | - සාමාන්‍ය මිල මට්ටම ඉහළ යාමේ වේගය අඩුවීම (මෙය අවධමනයට වඩා වෙනස් දෙයකි.) |
| **උද්ධමනය** | - සාමාන්‍ය මිල මට්ටම ඉහළ යාම. |
| **ජවන උද්ධමනය** | - උද්ධමනයේ සීඝ්‍ර ඉහළ යාමකි. එනම් සාමාන්‍ය මිල මට්ටම ඉහල යාමේ වේගය සියයට 100 කින් හෝ ඊට වැඩියෙන් සිදුවීම. |
| **නිශ්චල උද්ධමනය** | - අඩු ආර්ථික වර්ධනයත් සහ ඉහළ යන උද්ධමනයත් යන ගැටළු දෙකම රටක එකවර පැවතීම මේ නමින් හඳුන්වනු ලැබේ. |
| **යටිදැරි උද්ධමනය** | - රටේ සමස්ත ඉල්ලුමේ සහ සැපයුමේ සමතුලිත බව පිළිබිඹු කරන්නා වූ සාමාන්‍ය මිල මට්ටමේ උපනතිය. |

**වැඩිදුර විස්තර සඳහා:**

**ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**30, ජනාධිපති මාවත, කොළඹ 01**
**දුරකථනය: 2477418, 2477639, 2477420, 2477000,**
**වෙබ් අඩවිය: www.centralbanklanka.org**

**ප්‍රකාශන අලෙවි කවුළුව**

**මහ බැංකු අධ්‍යයන කේන්ද්‍රය**
**58, ශ්‍රී ජයවර්ධනපුර මාවත**
**රාජගිරිය**
**දුරකථනය: 2477829, 2477803**

මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී



Final Proof 2006. 06. 19